# අභ්‍යන්තර සටහන

## ශික්ෂණ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2023-06- 05 |
| වෙත | සියළු වාට්ටු/ඒකක/අංශ ප්‍රධානීන් |
| වෙතින් | අධ්‍යක්ෂ ශික්ෂණ රෝහල, බදුල්ල |
| පිටපත් | ගණකාධිකාරි,විශේෂ ශ්‍රේණියේ ප්‍රධාන හෙද නිලධාරි, අදාළ අතිකාල විෂය භාර නිලධාරීන්, ප්‍රධාන රෝහල් ඕවසියර් මගින් උපස්ථායක/සෞඛ්‍ය කාර්ය සහායක සියළු සේවක මහත්ම මහත්මීන් |
| විෂයය | සති විවේක දිනවල හා රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවයේ යෙදවීම උපස්ථායක හා සෞඛ්‍ය කාර්ය සහායක |
| ගොනු අංකය | BD/PGH/CPHMA/1/2013 |

මෙම රෝහලේ සේවයේ නියුතු උපස්ථායක හා සෞඛ්‍ය කාර්ය සහායක මහත්ම මහත්මීන් සේවයේ යොදවා ගැනීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කර සේවයේ යොදවා ගන්නා ලෙස මෙයින් දන්වමි.

01. යම් වාට්ටුවක හෝ ඒකකයක/අංශයක පවත්නා සේවා අවශ්‍යතාවය හා සෞඛ්‍ය අමාත්‍යංශයේ නිර්දේශිත කාර්ය මණ්ඩල උපමාන (Norms) අනුව එක් සේවා මුරයක සේවයේ යොදවාගත යුතු කාර්ය මණ්ඩල සංඛ්‍යාව අදාළ ඒකකය භාර නිලධාරීන් විසින් හඳුනාගත යුතු අතර, ඒ අනුව මාසික සේවා මුර චක්‍රය සකස් කර රෝහල් ලේකම්/නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.සේවා මුර චක්‍රයේ පිටපතක් රෝහල් ඕවසියර් වෙත හා අතිකාල අංශය වෙත අදාළ මාසයේ 05 වෙනි දිනට පෙර ලබා දීමට වාට්ටු/ඒකක භාර ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය.

02. සෑම උපස්ථායක, සෞඛ්‍ය කාර්ය සහායක මහත්මයකුට හා මහත්මියකුට නිශ්චිත සති විවේක දිනයක් තිබිය යුතු අතර, එය සේවා මුර චක්‍රයේ සඳහන් කළ යුතු අතර, සති විවේක දිනය ලබා ගන්නේනම් එය වාට්ටු/ඒකක භාර නිලධාරියාගේ එකඟත්වය ඇතිව තවත් සේවකයකු අතර එම මාසය තුළ අවශ්‍යතාවය පරිදි මාරු කර ගත හැකිය. සතිවිවේක දිනය මාරු කිරීම කළ යුත්තේ එම දිනය සඳහා අදාළ සේවකයින්ට අමතර ගෙවීමක් සිදු නොකරන්නේනම් පමණි.

03. සේවා චක්‍රය සකස් කරන අවස්ථාවේදී අනියම් නිවාඩු ලබා ගැනීමට යම් සේවකයකු හෝ සේවිකාවක අදහස් කරන්නේනම් ඒ බව ද මාසික සේවා චක්‍රය තුළ සටහන් කර, ඒ අනුව එදිනට වාට්ටුව/ඒකකය පවත්වාගෙන යාමට අවශ්‍ය සේවක සංඛ්‍යාව සැළසුම් කර ගත යුතුය.

04. සතිවිවේක දිනයක, රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයක යම් සේවකයකු හෝ සේවිකාවක සේවයේ යොදවා ගැනීම අත්‍යවශ්‍යවන අවස්ථාවකදී එය සේවා මුර චක්‍රය තුළ සටහන් කර තිබිය යුතු අතර, වාට්ටුව/ඒකකය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍යම සේවක සංඛ්‍යාව පමණක් සේවයේ යොදවා ගත යුතුය. සේවා මුර චක්‍රයක සටහන් කර නොමැති සති විවේක දින/රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින සඳහා අමතර දීමනා ගෙවනු නොලැබේ.

05. ආයතන සංග්‍රහය Xii පරිච්ඡේදය අනුව යම් සේවකයකු හෝ සේවිකාවක නිවාඩු අනුමත කරවා ගැනීම නිවාඩු ලබා ගැනීමට දින 07 කටවත් පෙර අනුමත කර ගත යුතුය. හදිසි අසනීප තත්වයක් ඇතිවී සේවයට වාර්තා කළ නොහැකිවන අවස්ථාවකදී ඒ බව අදාළ වාට්ටු/ඒකක භාර ප්‍රධානියාට හා රෝහල් ඕවසියර්ට දැනුම් දිය යුතු අතර, විමධ්‍යගත ප්‍රධානියාද විධිමත් ක්‍රමවේදයකින් දැනුවත් කළ යුතුය. එම දිනයේදී ඇතිවන පුරප්පාඩුව සඳහා වෙනත් සේවකයකු අතිකාල පදනම යොදවා ගැනීමට වාට්ටු/ඒකක භාර ප්‍රධානියා ක්‍රියා කළ යුතුය. එවැනි සේවකයකු නොමැති වුවහොත් රෝහල් ඕවසියර් විසින් ඒ සම්බන්ධව කටයුතු කර සුදුසු වෙනත් සේවකයකු අතිකාල පදනම මත හෝ ලබා දීමට කටයුතු කළ යුතු වේ. ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති බව හැඟී ගියහොත් ඒ බව අදාළ වාට්ටු/ඒකක භාර නිලධාරියා දැනුවත් කර ප්‍රතිකාර සේවා බාධාවකින් තොරව පවත්වාගෙන යාමට සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කිරීමට රෝහල් ඕවසියර් හා වාට්ටු/ඒකක භාර නිලධාරියා කටයුතු කළ යුතු වේ.

06. සේවාමුර චක්‍රයට අමතරව සතිවිවේක දින හෝ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින අමතර උපස්ථායක, සෞඛ්‍ය කාර්ය සහායක සේවක මහත්ම මහත්මීන් යොදවා ගැනීමට අත්‍යවශ්‍ය වුවහොත් එම සේවා අවශ්‍යතාවය හා එසේ යොදවනු ලබන සේවකයින් සම්බන්ධ විස්තර රෝහල් ඕවසියර් මගින් රෝහල් ලේකම්/නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

07. අනුමත සේවා චක්‍රයේ වෙනස්වීම් ඇත්නම් සංශෝධිත සේවා චක්‍රයක් අතිකාල අංශය වෙත ලැබිය යුතු අතර, රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවයේ යෙදෙන්නේනම් ඒ බව අතිකාල වවුචරයේ සටහන් කිරීම අනිවාර්ය වේ.

08. වාට්ටු හා ඒකකවල සේවයේ යොදවනු ලබන කාර්ය මණ්ඩලය යම් සතිවිවේක දිනයක හෝ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයක සේවයේ යොදවාගනු ලබන්නේ නම්, එම සතිවිවේක දිනයට/රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයට පෙර දින හෝ පසුදින සේවයේ යෙදීම අනිවාර්ය වේ.

09. සතිවිවේක දින හා රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවයේ යෙදෙන්නේනම්, මාසික සේවා චක්‍රය අනුව සම්පූර්ණ සේවා මුරයම ආවරණය වන පරිදි සේවයේ යෙදිය යුතුය.

10. සතිවිවේක දින හා රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල අමතර දීමනා සහිතව සේවයේ යොදවා ගනු ලබන්නේ රෝහල් ප්‍රතිකාර සේවා බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාමේ මුඛ්‍ය අරමුණින් බැවින්, සියළු කාර්ය මණ්ඩලය ඒ සම්බන්ධව අවබෝධ කරගෙන ගුණාත්මක හා ප්‍රශස්ත රෝගී සත්කාර සේවයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

11. ආයතන සංග්‍රහය, රෝහල් කළමනාකරණ උපදෙස් හා චක්‍ර ලේඛ අනුව මෙය නිකුත් කර ඇති බව දන්වමි.

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin) MD(Med.Admin)
Director
Teaching Hospital, Badulla.